# කාගිල්ස් බැංකු රූපමය කාඩ්පත (Image Card) - නිතර අසන ප්‍රශ්න

1. කාගිල්ස් බැංකු රූපමය කාඩ්පත් යන්නෙන් අදහස් කරන්නේ කුමක්ද?

   ඔබ කැමති පරිදි ඔබගේම ඡායාරූපයක් හෝ කාගිල්ස් බැංකු ඡායාරූප ගැලරිය සතු ඡායාරූපයක් හෝ භාවිතයෙන් ඔබගේ කාගිල්ස් බැංකු ක්‍රෙඩිට් කාඩ්පත නිර්මාණය කර ගැනීමේ හැකියාව පවතී.

2. කාගිල්ස් බැංකු රූපමය කාඩ්පතක් සඳහා අයදුම් කල හැක්කේ කෙසේද?

   අපගේ ඕනෑම කාගිල්ස් බැංකු ශාඛාවක් වෙත පිවිස රූපමය කාඩ්පත් සඳහා වන අයදුම්පත සම්පූර්ණ කිරීම මගින් කාගිල්ස් බැංකු රූපමය කාඩ්පතක් සඳහා පහසුවෙන් අයදුම් කල හැක.

3. මගේ කාගිල්ස් බැංකු රූපමය කාඩ්පත සඳහා යොදා ගත හැක්කේ කුමන ආකාරයේ ඡායාරූපද?

   ඔබට ඔබගේ ඕනෑම ඡායාරූපයක් යොදා ගත හැක.
   එමෙන්ම ඔබට කාගිල්ස් බැංකු ඡායාරූප ගැලරිය සතු ඡායාරූප අතරින් තෝරා ගැනීමේ හැකියාව පවතී.
   කරුණාකර රූපමය කාඩ්පත් සඳහා වන මාර්ගෝපදේශ වෙත යොමුවන්න.

4. මාගේ රූපමය කාඩ්පත අනුමතවී හෝ ප්‍රතික්ෂේප වී ඇති බව දැන ගත හැක්කේ කෙසේද?

   ඔබගේ ඡායාරූපයෙහි තත්වය පිලිබඳ බැංකුව වෙතින් ඔබ වෙත තහවුරු කිරීමේ ඇමතුමක් ලැබෙනු ඇත.

5. මාගේ රූපමය කාඩ්පත සඳහා යෙදිය යුතු ඡායාරූපය අන්තර්ජාලය හරහා බැංකුව වෙත එවීමේ හැකියාව (upload) පවතීද?

   නැත.

6. කාගිල්ස් බැංකු රූපමය කාඩ්පත සඳහා අදාළ වන ගාස්තු මොනවාද?

   නව කාඩ්පත් , තමාගේම ඡායාරූප - රූපමය කාඩ්පත් සේවා ගාස්තු රු. 750/-
   නව කාඩ්පත් , ගැලරි ඡායාරූප - රූපමය කාඩ්පත් සේවා ගාස්තු රු. 500/-
   ඡායාරූප ආදේශනය - ඡායාරූප ආදේශන ගාස්තු රු. 250/- + කාඩ්පත් ආදේශන ගාස්තු රු. 500/- (දැනට සිටින පාරිභෝගිකයින් සඳහා පමණි)

7. මාගේ කාගිල්ස් බැංකු රූපමය කාඩ්පත අස්ථානගත වී ඇත. මා මින් පෙර යොදා ගත් ඡායාරූපම යොදා මා හට නව කාඩ්පතක් ලබා ගත හැකිද?

   ඔව්. එම ඡායාරූපයම යොදා ගනිමින් ඔබගේ රූපමය කාඩ්පත ආදේශනය කල හැක.

8. රූපමය කාඩ්පත ආදේශනය සඳහා ගාස්තුවක් අයවේද?

   ඔව්. රූපමය කාඩ්පත ආදේශනය සඳහා රු. 500/-ක ගාස්තුවක් අය වේ.

9. මාගේ රූපමය කාඩ්පතෙහි ඡායාරූපය වෙනස් කර ගැනීමේ ක්‍රියා පටිපාටිය කුමක්ද?

ඔබට නව කාගිල්ස් බැංකු රූපමය කාඩ්පත් සඳහා වන අයදුම්පතක් සම්පූර්ණ කිරීමට සිදු වන අතර එය ඔබගේ නව ඡායාරූපය සමගින් අපගේ බැංකු ශාඛාවක් වෙත භාර දිය යුතුය.

10. එක් කාඩ්පතක මුද්‍රණය කිරීම සඳහා ඡායාරූප කිහිපයක් ලබා දීමේ හැකියාව පවතීද?

නැත. එක් කාඩ්පතක් සඳහා ඡායාරූප කිහිපයක් යොදා ගත නොහැක.

11. මාගේ කාගිල්ස් බැංකු ඩෙබිට් කාඩ්පතෙහි රූපය වෙනස් කිරීමේ හැකියාව පවතීද?

රූපමය කාඩ්පත් සේවාව අදාළ වන්නේ කාගිල්ස් බැංකු ක්‍රෙඩිට් කාඩ්පත් සඳහා පමණි.

12. රූපමය කාඩ්පතක් සඳහා අයදුම්පතද සමගින් නව ක්‍රෙඩිට් කාඩ්පතක් සඳහා වන අයදුම්පත්‍රය ඉදිරිපත් කල හැක්කේ කෙසේද?

පාරිභෝගිකයා විසින් ක්‍රෙඩිට් කාඩ්පත් අයදුම්පත සහ රූපමය කාඩ්පත් සඳහා වන අයදුම්පත සම්පූර්ණ කල යුතුය. බැංකු ශාඛා සහකාර විසින් මෙම ක්‍රෙඩිට් කාඩ්පත් අයදුම්පතෙහි ක්‍රෙඩිට් කාඩ්පත් පිරික්සුම් ලැයිස්තුවෙහි සඳහන් රූපමය කාඩ්පත් සඳහා වන අංශය වෙත යොමු කරනු ඇත.

13. බැංකු ශාඛාව විසින් පාරිභෝගිකයාගේ ඡායාරූපය කාඩ්පත් මධ්‍යස්ථානය වෙත ලබා දෙන්නේ කෙසේද?

පාරිභෝගිකයාගේ ජාතික හැඳුනුම්පත් අංකය සහ පාරිභෝගිකයාගේ ඡායාරූපය සඳහා වන යොමු අංකය සමගින්, අදාළ කාඩ්පත් මධ්‍යස්ථාන නියෝජිතයා විසින් මෙහෙයවනු ලබන පොදු ජංගම දුරකථන අංකයක් වෙත ඕනෑම ඩිජිටල් මාධ්‍යක් හරහා ඡායාරූපය හුවමාරු කර ගනු ඇත.